# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022 මැයි 15 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2022 මාර්තු

## සමස්ත නිරීක්ෂණ

2022 වසරේ මාර්තු මාසයේ දී අපනයන ඉපැයීම්, වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව සුළු අඩු වීමක් වාර්තා කළ ද, අඛණ්ඩව දසවන මාසයටත් එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවා ගියේය. මේ අතර, ආනයන වියදම්, 2021 වසරේ පෙබරවාරි මාසයෙන් පසු පළමු වරට, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, වෙළඳ හිඟය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2022 වසරේ මාර්තු මාසයේ දී පහළ ගියේය. සංචාරක පැමිණීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, පෙර මාසයට සාපේක්ෂව, 2022 වසරේ මාර්තු මාසයේ දී කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. 2022 වසරේ මාර්තු මාසය තුළ දී, කොළඹ කොටස් වෙළඳපොළ වෙත ලැබුණු විදේශ ආයෝජනයන්හි ශුද්ධ ලැබීමක් වාර්තා විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ අන්තර් දින විනිමය අනුපාතිකයෙහි යම් ඉහළ විචලනයක් ඇතිවීම වැළැක්වීමේ අරමුණින් මහ බැංකුව විසින් 2022 වසරේ මැයි මස 13වැනි දින සිට අන්තර් බැංකු බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකයෙහි මධ්‍යය අනුපාතිකයක් සහ විචලන සීමාව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කළේය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2021 මාර්තු එ.ජ.ඩො. මිලියන | 2022 මාර්තු එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2021 ජන. - මාර්තු එ.ජ.ඩො. මිලියන | 2022 ජන. - මාර්තු එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 1,094 | 1,057 | -3.4 | 2,982 | 3,249 | 9.0 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,926 | 1,819 | -5.6 | 5,041 | 5,651 | 12.1 |
| වෙළඳ ශේෂය | -832 | -762 | | -2,059 | -2,402 | |
| සංචාරක ඉපැයීම් | 12 (ආ) | 192 (ඇ) | - | 25 (ආ) | 513 (ඇ) | - |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 612 | 318 | -48.0 | 1,867 | 783 | -58.1 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -21 | 10 | | -91 | 95 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 177 | - | | 367 | 271 (ඉ) | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 4 | - | | 7 | 5 | |
| දිගුකාලීන ණය | 173 | ලැ.නො. | | 360 | 266 (ඉ) | |
| සමස්ත ශේෂය | | | | -1,101 | -2,269 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2022 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) දිගු කාලීන ණය සඳහා සමුච්චිත දත්තවලට විදේශීය ණය ඇතුළත් වන්නේ 2022 වසරේ පෙබරවාරි මාසය දක්වා පමණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ භාණ්ඩ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය:** වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ මාර්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 832ක සහ 2022 වසරේ පෙබරවාරි මස වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 781ක හිඟයට සාපේක්ෂව, 2022 වසරේ මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 762ක් දක්වා පහළ ගියේය. කෙසේ වුවද, 2022 වසරේ ජනවාරි සිට මාර්තු දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,059 සිට එ.ජ. ඩොලර් මිලියන 2,402ක් දක්වා පුළුල් විය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟය පුළුල් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව 2022 වසරේ මාර්තු මාසයේ දී සියයට 16.0කින් පහළ ගිය අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන මිල ගණන් පහළ යෑමට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2022 වසරේ ජනවාරි - මාර්තු දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (අගය එ.ජ. ඩොලර් මිලියනවලින්)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2021-2022)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2021-2022)**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**සමස්ත අපනයන: 2022 වසරේ මාර්තු මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,057ක් දක්වා, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව සියයට 3.4කින් පහළ ගියේය.** එහිදී, කෘෂිකාර්මික අපනයන සහ ඛනිජමය අපනයන ඉපැයීම්වල පහළ යෑමක් දක්නට ලැබූ අතර, කාර්මික අපනයනවල වර්ධනයක් වාර්තා විය. කෙසේ වුවද, 2022 වසරේ ජනවාරි සිට මාර්තු දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්ත අපනයන ආදායම, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,249ක් දක්වා සියයට 9.0කින් ඉහළ ගියේය.

**කාර්මික අපනයන:** කාර්මික භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව 2022 වසරේ මාර්තු මාසයේ දී සියයට 2.9කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ (ප්‍රධාන වශයෙන්, මැණික්) අපනයන ඉපැයීම් ඉහළ යෑම මේ සඳහා හේතු විය. ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ඉපැයීම් ඉහළ යෑම සඳහා නැව් සහ ගුවන්යානා සඳහා යොදාගනු ලබන ඉන්ධන අපනයන මිල ගණන් සහ ගුවන්යානා සඳහා යොදා ගනු ලබන ඉන්ධන අපනයන පරිමාවන් ඉහළ යෑම හේතු විය. තවද, මූල ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ඊයම් සහ ඇලුමිනියම් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත), සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් (ප්‍රධාන වශයෙන්, පාවහන්), ප්‍රවාහන උපකරණ (ප්‍රධාන වශයෙන්, සංචාරක නැව්) සහ සත්ත්ව ආහාර (ප්‍රධාන වශයෙන්, කුකුළු ආහාර) අපනයනවල සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. කෙසේ වුවද, රබර් නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ගෘහාශ්‍රිත කටයුතු සඳහා යොදාගන්නා රබර් අත්වැසුම්), ආහාර, පාන වර්ග සහ දුම්කොළ (ප්‍රධාන වශයෙන්, සකස් කළ දුම්කොළ, සත්ත්ව හෝ එළවළු මේද සහ තෙල් වර්ග සහ පිටිකළ පොල් කිරි), රෙදිපිළි (ප්‍රධාන වශයෙන්, නූල්), මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, මුදල් නෝට්ටු), ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ප්ලාස්ටික් මලු සහ බෑග්), රසායනික නිෂ්පාදිත සහ පිඟන්මැටි නිෂ්පාදිත යන කාණ්ඩයන්හි ඉපැයීම් පහළ යෑමක් වාර්තා කළේය. ඇඟලුම් අපනයනවල සුළු අඩු වීමක් දක්නට ලැබුණ ද, බොහෝ ප්‍රධාන වෙළඳපොළවල් සඳහා වූ ඇඟලුම් අපනයන වර්ධනය විය.

**කෘෂිකාර්මික අපනයන:** කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයෙන් ලද සමස්ත ආදායම, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව, 2022 වසරේ මාර්තු මාසයේ දී සියයට 22.6කින් පහළ ගිය අතර, අපනයන පරිමාවන් අඩු වීම තුළින් සියලුම උපකාණ්ඩ යටතේ අපනයන ආදායම සමස්තයක් ලෙස පහළ යෑම මේ සඳහා හේතු විය. අපනයනය කළ තේ පරිමාවන් සහ මිල ගණන් පහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 24.0කින් පහළ ගියේය. කුරුඳු, ගම්මිරිස් සහ කරාබු නැටි අපනයන පරිමාවන් පහළ යෑම හේතුවෙන් 2022 වසරේ මාර්තු මාසයේ කුළුබඩු අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 39.8කින් පහළ ගියේය.

**ඛනිජමය අපනයන:** ලෝපස්, ලෝබොර සහ අළු කාණ්ඩය යටතේ වර්ග කරන ලද ටයිටේනියම් ලෝපස් අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව 2022 වසරේ මාර්තු මාසයේ දී ඛනිජ අපනයන ආදායම සියයට 57.1කින් පහළ ගියේය.

[1] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් අපනයන සංයුතිය ඇමුණුම Iහි දක්වා ඇත.

**අපනයන දර්ශක:** අපනයන පරිමාවන් සහ මිල ගණන් පහළ යෑමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස, අපනයන ආදායම පහළ ගිය බව නිරූපණය කරමින්, 2022 වසරේ මාර්තු මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, අපනයන පරිමා දර්ශකය සියයට 1.6කින් (ප්‍රධාන වශයෙන්, කෘෂිකාර්මික අපනයන හේතුවෙන්) සහ ඒකක මිල දර්ශකය සියයට 1.8කින් පහළ ගියේය.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: මාසික අපනයන ඒකක මිල දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2021 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2022 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **829.8** | **853.9** | **2.9** | **2,302.4** | **2,627.8** | **14.1** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 51.0 | 46.6 | -8.6 | 132.4 | 138.7 | 4.8 |
| සත්ත්ව ආහාර | 9.0 | 10.8 | 19.2 | 29.6 | 35.6 | 20.3 |
| රෙදිපිළි හා ඇඟලුම් | 467.2 | 464.4 | -0.6 | 1,333.5 | 1,477.0 | 10.8 |
| එයින්, ඇඟලුම් | 425.3 | 424.9 | -0.1 | 1,219.1 | 1,360.6 | 11.6 |
| රෙදිපිළි | 31.0 | 28.5 | -7.8 | 78.4 | 84.0 | 7.1 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 11.0 | 11.0 | -0.2 | 36.0 | 32.4 | -10.0 |
| රබර් නිෂ්පාදිත | 95.2 | 81.3 | -14.5 | 256.3 | 251.7 | -1.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 27.7 | 38.3 | 38.3 | 70.8 | 93.7 | 32.3 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 44.2 | 44.3 | 0.2 | 124.9 | 133.8 | 7.1 |
| ප්‍රවාහන උපකරණ | 10.9 | 13.8 | 26.6 | 26.7 | 34.0 | 27.2 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 28.8 | 55.5 | 93.1 | 85.8 | 179.5 | 109.2 |
| රසායනික නිෂ්පාදිත | 20.5 | 18.9 | -7.9 | 53.0 | 52.3 | -1.3 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 12.4 | 12.9 | 4.2 | 31.2 | 37.6 | 20.3 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 6.1 | 3.5 | -43.0 | 9.7 | 14.6 | 49.9 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 3.2 | 6.9 | 114.3 | 11.2 | 17.0 | 52.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 7.4 | 5.5 | -25.5 | 19.2 | 18.4 | -4.5 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 14.2 | 18.6 | 30.6 | 33.4 | 50.2 | 50.4 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 3.6 | 3.0 | -16.7 | 9.3 | 8.7 | -5.9 |
| වෙනත් කාර්මික අපනයන | 28.4 | 29.6 | 4.3 | 75.4 | 85.3 | 13.2 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **257.3** | **199.3** | **-22.6** | **663.8** | **605.9** | **-8.7** |
| තේ | 124.6 | 94.7 | -24.0 | 338.1 | 286.8 | -15.2 |
| රබර් | 5.5 | 4.7 | -15.2 | 12.2 | 14.6 | 20.0 |
| පොල් | 41.2 | 36.7 | -10.9 | 96.3 | 104.7 | 8.8 |
| කුළුබඩු | 38.6 | 23.2 | -39.8 | 113.8 | 85.3 | -25.0 |
| එළවළු | 3.3 | 2.1 | -36.7 | 6.5 | 6.0 | -8.2 |
| සකස් නොකළ දුම්කොළ | 4.0 | 2.8 | -29.5 | 8.6 | 7.2 | -16.6 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 14.6 | 12.5 | -13.9 | 31.9 | 33.5 | 5.1 |
| මුහුදු ආහාර | 25.4 | 22.4 | -11.6 | 56.4 | 67.7 | 20.1 |
| **3. ඛනිජ අපනයන** | **4.7** | **2.0** | **-57.1** | **11.8** | **10.4** | **-11.6** |
| **4. වර්ග නොකළ අපනයන** | **2.0** | **1.7** | **-17.7** | **4.3** | **5.2** | **21.9** |
| **මුළු අපනයන** | **1,093.8** | **1,056.9** | **-3.4** | **2,982.2** | **3,249.3** | **9.0** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: 2022 වසරේ ජනවාරි මාසයේ සිට මාසික ලක්ෂ්‍යමය පදනම මත පහත වැටෙමින් තිබෙන වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ පෙබරවාරි මාසයට පසුව පළමු වරට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම වශයෙන් ද පහළ යෑමක් වාර්තා කරමින්, අඛණ්ඩව පහළ ගියේය. ඒ අනුව ආනයන වියදම 2021 වසරේ මාර්තු මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,926ට සාපේක්ෂව 2022 වසරේ මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,819ක් දක්වා සියයට 5.6කින් පහළ ගියේය.** එහිදී, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා දරන ලද වියදමෙහි පහළ යෑමක් නිරීක්ෂණය වූ අතර, අන්තර් භාණ්ඩ ආනයනයෙහි ඉහළ යෑමක් වාර්තා විය. සමුච්චිත පදනම මත 2022 වසරේ පළමු කාර්තුව තුළ දී එ.ජ. ඩොලර් මිලියන 5,651ක් වූ සමස්ත ආනයන වියදම සියයට 12.1ක ඉහළ යෑමක් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) වාර්තා කළේය. විදේශීය අංශයෙහි අඛණ්ඩ පීඩනය සලකා බලමින් 2022 වසරේ මාර්තු මාසයේ දී, රජය විසින් ආනයන බදු ඉහළ දැමීම සහ තෝරා ගත් හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා ආනයන බලපත්‍ර අවශ්‍යතා පැනවීම වැනි ආනයන සීමා කිරීම් කිහිපයක් පනවන ලදී.

**පාරිභෝගික භාණ්ඩ:** පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව, ආහාර සහ පාන වර්ග සඳහා සියයට 13.6කින් ද, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා සියයට 37.8කින් ද වූ වියදම් පහළ යෑමත් සමඟ, 2022 වසරේ මාර්තු මාසයේ දී සියයට 25.7කින් පහළ ගියේය. ආහාර සහ පාන වර්ගවල ආනයන වියදමේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්, සීනි සහ එළවළු (ප්‍රධාන වශයෙන්, ළූණු සහ පරිප්පු) ආනයන පරිමා පහළ යෑම හේතු විය. තවද, තෙල් සහ මේද වර්ග (ප්‍රධාන වශයෙන්, පොල් තෙල්), කිරි ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, කිරි පිටි) සහ කුළුබඩු (ප්‍රධාන වශයෙන්, මිරිස්) ආනයන පරිමා පහළ යෑම හේතුවෙන් ආනයන වියදමෙහි සැලකිය යුතු පහළ යෑමක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන්, සහල් ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව 2022 වසරේ මාර්තු මාසයේ දී ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත මත ආනයන වියදම ඉහළ අගයක පැවතුණි. පාන වර්ග ආනයන වියදම ද යම් ප්‍රමාණයකට ඉහළ ගියේය. මූලිකවම, විදුලි සංදේශ උපකරණ (ප්‍රධාන වශයෙන්, ජංගම දුරකථන) ගෘහ උපකරණ (ප්‍රධාන වශයෙන්, රූපවාහිනී යන්ත්‍ර) සහ බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ඖෂධ) ආනයන පහළ යෑම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ මත වියදම පහළ ගිය නමුත්, පාවහන් සහ ඇඳුම් කට්ටල වැනි රෙදිපිළි සහ උපාංග ආනයන වියදම ඉහළ ගියේය.

**අන්තර් භාණ්ඩ:** වසරකට පෙර පැවති අගය හා සැසඳීමේ දී, අන්තර් භාණ්ඩ ආනයන වියදම, 2022 වසරේ මාර්තු මාසයේ දී සියයට 4.2කින් ඉහළ ගියේය. ඉන්ධන ආනයන ඉහළ යෑම මෙම ඉහළ යෑම සඳහා හේතු වූ අතර, වෙනත් බොහෝ අන්තර් භාණ්ඩයන්හි ආනයන වියදම පහළ යෑම මධ්‍යයේ මෙම ප්‍රතිඵලය වාර්තා විය. මෙම වෙනත් අන්තර් භාණ්ඩ අතරට මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ සහ වානේ) රසායනික

[2] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් ආනයන සංයුතිය ඇමුණුම IIහි දක්වා ඇත.
.

නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ඩයි වර්ග පඬු ගැන්වීමේ හා වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය සහ අකාබනික රසායන ද්‍රව්‍ය), ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, රථවාහන සහ යන්ත්‍රෝපකරණ කොටස් (ප්‍රධාන වශයෙන්, විද්‍යුත් යාන්ත්‍රික කොටස් සහ රථවාහන කොටස්) සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග (ප්‍රධාන වශයෙන්, නූල්) ඇතුළත් විය. බොර තෙල් ආනයනය නොකළ ද, 2012 වසරේ මාර්තු මාසයට පසුව වාර්තා වූ ඉහළම ඉන්ධන ආනයන අගය වන එ.ජ. ඩොලර් මිලියන 520ක අගයක් වාර්තා කරමින්, ඉන්ධන (පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු ඇතුළුව) ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 49.7කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ඉන්ධන ආනයන සාමාන්‍ය මිල ගණන් ඉහළ යෑම හේතු විය.

**ආයෝජන භාණ්ඩ:** 2022 වසරේ මාර්තු මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.9කින් පහළ ගිය අතර, ඒ සඳහා යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන ආයෝජන භාණ්ඩ තෙවර්ගයේම ආනයන පහළ යෑම හේතු විය. ප්‍රධාන වශයෙන්, විදුලි මෝටර් සහ ජනක යන්ත්‍ර කට්ටල, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොටස්, කාර්යාල යන්ත්‍රසූත්‍ර සහ ට'බයින ආනයන අඩු වීම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම පහත වැටුණි. මේ අතර, සිමෙන්ති සහ යකඩ හා වානේ මත වියදම ඉහළ ගිය ද, ඇලුමිනියම් උපාංග, යකඩ සහ වානේ උපාංග හා දැව නිෂ්පාදන ආනයන වියදම පහළ යෑම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පහළ ගියේය. එමෙන්ම ප්‍රධාන වශයෙන්, ටැංකි, බවුසර් රථ සහ ට්‍රැක්ටර් ආනයන පහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහළ ගියේය.

**ආනයන දර්ශක:** 2022 වසරේ මාර්තු මාසයේ දී ආනයන වියදම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආනයන පරිමා හේතු වූ බව නිරූපණය කරමින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ආනයන පරිමා දර්ශකය සියයට 19.2කින් පහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 16.9කින් ඉහළ ගියේය.

## රූප සටහන 7: මාසික ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 8: මාසික ආනයන පරිමා දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 9: මාසික ආනයන ඒකක මිල දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2021 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2022 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **379.6** | **282.0** | **-25.7** | **997.9** | **940.8** | **-5.7** |
| ආහාර හා පාන වර්ග | 189.7 | 163.9 | -13.6 | 505.3 | 512.5 | 1.4 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.7 | 35.7 | 1,207.7 | 9.5 | 137.9 | 1,358.9 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 35.4 | 29.4 | -16.7 | 90.2 | 82.9 | -8.0 |
| එළවළු (ආ) | 43.4 | 28.1 | -35.3 | 111.1 | 90.6 | -18.4 |
| මුහුදු ආහාර | 7.2 | 6.4 | -10.9 | 24.7 | 22.9 | -7.2 |
| සීනි හා රසකැවිලි | 50.8 | 22.7 | -55.3 | 137.4 | 66.5 | -51.6 |
| කුළුබඩු | 18.9 | 14.7 | -22.3 | 37.7 | 41.6 | 10.4 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 31.3 | 26.9 | -14.1 | 94.9 | 70.1 | -26.1 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 189.9 | 118.1 | -37.8 | 492.6 | 428.3 | -13.1 |
| පෞද්ගලික රථවාහන | 1.0 | 0.7 | -30.7 | 2.4 | 2.1 | -14.5 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 57.7 | 42.9 | -25.7 | 143.8 | 166.4 | 15.7 |
| ගෘහ උපකරණ | 31.8 | 12.2 | -61.7 | 71.2 | 46.2 | -35.0 |
| රෙදිපිළි හා උපාංග | 19.8 | 23.5 | 18.6 | 55.7 | 72.0 | 29.2 |
| විදුලි සංදේශ උපකරණ | 40.6 | 10.2 | -74.8 | 109.8 | 35.5 | -67.6 |
| ගෘහ හා දැව භාණ්ඩ | 13.3 | 12.0 | -10.1 | 42.8 | 48.0 | 12.2 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 25.6 | 16.6 | -35.1 | 66.8 | 58.0 | -13.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **1,129.9** | **1,177.8** | **4.2** | **2,990.7** | **3,610.1** | **20.7** |
| ඉන්ධන | 347.2 | 519.8 | 49.7 | 977.2 | 1,412.3 | 44.5 |
| එයින්, බොරතෙල් | - | - | - | 127.1 | 110.1 | -13.4 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 310.5 | 429.9 | 38.5 | 753.5 | 1,079.9 | 43.3 |
| ගල්අඟුරු | 36.7 | 90.0 | 145.3 | 96.6 | 222.3 | 130.2 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 13.3 | 22.4 | 68.3 | 36.4 | 48.9 | 34.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 250.9 | 240.8 | -4.0 | 710.2 | 880.5 | 24.0 |
| කඩදාසි හා ඝන කඩදාසි | 42.7 | 40.6 | -4.9 | 105.8 | 122.2 | 15.5 |
| කෘෂිකාර්මික යෙදවුම් | 25.0 | 21.8 | -12.6 | 67.5 | 56.9 | -15.7 |
| තිරිඟු හා ඉරිඟු | 31.1 | 24.2 | -22.1 | 93.5 | 81.7 | -12.6 |
| මූල ලෝහ | 86.6 | 31.4 | -63.7 | 153.5 | 177.8 | 15.9 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 83.6 | 64.1 | -23.3 | 200.7 | 208.0 | 3.6 |
| රසායනික නිෂ්පාදිත | 109.1 | 87.2 | -20.0 | 274.6 | 266.5 | -2.9 |
| පොහොර | 16.3 | 14.9 | -8.4 | 35.0 | 21.6 | -38.3 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 40.6 | 29.9 | -26.4 | 101.1 | 97.1 | -4.0 |
| ඛනිජමය නිෂ්පාදිත | 8.0 | 16.9 | 112.2 | 27.7 | 45.8 | 65.2 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 75.7 | 63.7 | -15.9 | 207.6 | 190.8 | -8.1 |
| **3. ආයෝජන භාණ්ඩ** | **416.3** | **358.5** | **-13.9** | **1,050.1** | **1,098.8** | **4.6** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 274.6 | 227.2 | -17.3 | 685.1 | 695.2 | 1.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 106.7 | 102.3 | -4.2 | 283.6 | 341.8 | 20.5 |
| ප්‍රවාහන උපකරණ | 34.8 | 28.6 | -17.7 | 80.9 | 60.4 | -25.3 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.2 | 0.4 | 106.8 | 0.5 | 1.4 | 182.3 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.2** | **0.7** | **332.3** | **2.4** | **1.6** | **-36.6** |
| **මුළු ආනයන** | **1,925.9** | **1,818.9** | **-5.6** | **5,041.1** | **5,651.2** | **12.1** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,578.8** | **1,299.1** | **-17.7** | **4,064.0** | **4,238.9** | **4.3** |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** 2022 වසරේ පෙබරවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 205ක් සහ පෙර වසරේ මාර්තු මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 612ට සාපේක්ෂව 2022 වසරේ මාර්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 318ක් විය. නුපුහුණු (7,803), පුහුණු (7,661) සහ ගෘහ සේවිකා (7,575) යන කාණ්ඩ වල දායකත්වයෙන්, 2022 වසරේ මාර්තු මාසය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සමස්තය 26,177ක් ලෙස වාර්තා විය.

**සංචාරක පැමිණීම්:** 2022 වසරේ පෙබරවාරි මාසයේ වාර්තා වූ 96,507ක සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2022 වසරේ මාර්තු මාසයේ දී පැමිණි සංචාරකයන් ප්‍රමාණය 106,500ක් ලෙස වාර්තා විය. 2022 වසරේ මාර්තු මාසය තුළ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි රටවල් ලෙස ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, රුසියාව, සහ ප්‍රංශය පැවතුණි. 2022 වසරේ පෙබරවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 174ක් සහ පෙර වසරේ මාර්තු මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 12ට සාපේක්ෂව 2022 වසරේ මාර්තු මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 192ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 10: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 11: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

2022 වසරේ මාර්තු මාසය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජකයින් සම්බන්ධ ගනුදෙනු කිසිවක් සිදු වී නොමැත. 2022 වසරේ මාර්තු මාසය දක්වා වූ මාස තුන තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 4ක සමස්ත ශුද්ධ ලැබීමක් වාර්තා වූ අතර, නොපියවා ඉතිරිව ඇති විදේශීය ආයෝජන ප්‍රමාණය 2022 වසරේ මාර්තු මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 9ක් ලෙස අඩු මට්ටමක පැවතුණි. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, 2022 වසරේ මාර්තු මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 10ක ශුද්ධ ලැබීමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, 2022 වසරේ මාර්තු මාසයෙන් අවසන් වූ මාස තුන තුළ දී ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 95ක ශුද්ධ ලැබීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

2022 වසරේ මාර්තු මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 1.9ක් විය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.5කට සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීම යම් කොන්දේසි වලට යටත් වේ.

**රූප සටහන 12: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**2022 වසරේ මාර්තු මස මුල සිට විනිමය අනුපාතිකයේ කැපී පෙනෙන අවප්‍රමාණය වීමක් නිරීක්ෂණය විය.** මහ බැංකුව විසින් 2022 වසරේ මාර්තු මස මුල් සතියේ දී විනිමය අනුපාතිකය තීරණය කිරීමේ දී ක්‍රමානුකූල ගැලපීමක් සඳහා ඉඩ හරින ලදී. කෙසේ වෙතත්, විනිමය අනුපාතිකය මත අඛණ්ඩව ඇති වූ පීඩනයන් හේතුවෙන් වෙළඳපළ බලවේග මඟින් පසුව විනිමය අනුපාතිකය විශාල වශයෙන් අවප්‍රමාණයකට ලක් විය. ඒ අනුව, 2022 වසරේ මැයි 13 දක්වා වූ කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 44.3ක අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2022 වසරේ මැයි 13වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඉන්දියානු රුපියල සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය විය. 2022 වසරේ මැයි මස 12වැනි දින, මහ බැංකුව විසින් විනිමය අනුපාතිකයෙහි අන්තර් දින විචලන කළමනාකරණය කිරීමට ක්‍රියාමාර්ග ප්‍රකාශයට පත් කරන ලද අතර එමඟින් යම් ඉහළ විචලනයන් සීමා කරනු ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මහා බැංකුව 2022 වසරේ මැයි මස 13වැනි දින සිට, බැංකු අතර සිදුවන එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල් ගනුදෙනුවල බරිත සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය පදනම්ව, දෙපසටම අදාළ විචලන සීමා සහිතව, මධ්‍ය එතැන් විනිමය අනුපාතිකයක් ප්‍රකාශයට පත් කරනු ඇත. මෙම පියවර ඇතුළු අනෙකුත් පියවරයන් විනිමය අනුපාතිකය ශක්තිමත් කිරීමට උපකාරී වනු ඇතැයි

අපේක්ෂා කරන අතර, එමඟින් ඉදිරි කාලය තුළ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ ද්‍රවශීලතා පීඩනය ලිහිල් වනු ඇත.

**රූප සටහන 13: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම**

| මුදල් ඒකකය | 2020 | 2021 | 2022 (මැයි 13 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.6% | -7.0% | -44.3% |
| යූරෝ | -11.2% | +1.1% | -39.3% |
| ස්ටර්ලින් පවුම | -6.2% | -6.0% | -38.5% |
| ජපන් යෙන් | -7.5% | +3.8% | -37.6% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -11.4% | -1.2% | -41.3% |
| ඉන්දියානු රුපියල | 0.0% | -5.5% | -42.1% |

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම I:

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | 2021 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2022 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **256.8** | **203.9** | **-20.6** | **675.9** | **632.9** | **-6.4** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 28.9 | 26.4 | -8.4 | 64.7 | 77.6 | 19.8 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 6.1 | 6.6 | 7.7 | 18.6 | 18.1 | -2.6 |
| 05 එළවළු හා පලතුරු | 45.0 | 38.6 | -14.2 | 104.6 | 112.1 | 7.1 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 161.8 | 116.1 | -28.2 | 443.5 | 369.7 | -16.6 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **13.8** | **12.3** | **-10.7** | **33.5** | **33.3** | **-0.6** |
| 11 පාන වර්ග | 2.5 | 3.8 | 49.7 | 7.3 | 9.6 | 31.9 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 11.2 | 8.5 | -24.4 | 26.3 | 23.7 | -9.7 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **46.8** | **40.7** | **-13.0** | **110.6** | **121.1** | **9.4** |
| 23 සකස් නොකළ රබර් | 5.7 | 4.9 | -14.2 | 12.5 | 15.0 | 20.6 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 24.1 | 21.3 | -11.9 | 60.1 | 62.9 | 4.5 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **28.8** | **55.5** | **93.1** | **85.8** | **179.5** | **109.2** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 28.8 | 55.5 | 93.1 | 85.8 | 163.6 | 90.6 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | - | - | - | 15.9 | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **12.6** | **9.4** | **-25.0** | **29.8** | **25.4** | **-14.8** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 8.4 | 6.9 | -17.6 | 18.4 | 17.8 | -3.3 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **24.5** | **23.9** | **-2.6** | **67.3** | **64.1** | **-4.8** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **152.2** | **162.2** | **6.5** | **407.2** | **457.4** | **12.3** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 60.0 | 58.5 | -2.4 | 164.2 | 173.3 | 5.5 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 39.9 | 37.6 | -5.7 | 107.9 | 110.6 | 2.5 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 33.2 | 43.6 | 31.3 | 86.4 | 108.3 | 25.4 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **54.0** | **56.5** | **4.6** | **148.1** | **163.4** | **10.3** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 29.7 | 27.3 | -8.3 | 78.3 | 82.8 | 5.8 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **504.4** | **492.1** | **-2.4** | **1,423.7** | **1,571.9** | **10.4** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 462.6 | 450.4 | -2.6 | 1,319.0 | 1,447.8 | 9.8 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **-** | **0.3** | **-** | **0.2** | **0.3** | **63.4** |
| **මුළු අපනයන** | **1,093.8** | **1,056.9** | **-3.4** | **2,982.2** | **3,249.3** | **9.0** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම II:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | 2021 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2022 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.- මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **240.6** | **206.6** | **-14.1** | **637.1** | **650.8** | **2.2** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 35.4 | 29.6 | -16.4 | 90.3 | 83.1 | -7.9 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 7.3 | 6.5 | -10.6 | 25.0 | 23.2 | -7.0 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 33.3 | 59.3 | 78.0 | 101.9 | 218.3 | 114.2 |
| 05 එළවළු හා පලතුරු | 52.5 | 36.6 | -30.3 | 132.2 | 113.0 | -14.5 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 50.8 | 22.7 | -55.3 | 137.4 | 66.5 | -51.6 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 23.9 | 18.2 | -24.1 | 49.2 | 53.9 | 9.7 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **6.4** | **8.2** | **26.7** | **18.5** | **25.4** | **37.2** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **57.1** | **45.4** | **-20.4** | **143.2** | **141.1** | **-1.5** |
| 23 සකස් නොකළ රබර් | 36.3 | 25.2 | -30.7 | 89.2 | 81.2 | -9.0 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 3.1 | 1.7 | -46.3 | 5.9 | 7.0 | 18.1 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **347.2** | **519.8** | **49.7** | **977.2** | **1,412.3** | **44.5** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 261.6 | 407.0 | 55.6 | 788.3 | 1,120.4 | 42.1 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 48.8 | 22.8 | -53.2 | 92.2 | 69.6 | -24.6 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **25.5** | **19.8** | **-22.4** | **93.2** | **36.9** | **-60.4** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 22.0 | 17.1 | -22.6 | 86.3 | 30.2 | -65.1 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **263.1** | **205.9** | **-21.7** | **644.1** | **659.7** | **2.4** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 51.3 | 40.2 | -21.8 | 126.8 | 156.6 | 23.5 |
| 56 පොහොර | 16.3 | 14.9 | -8.4 | 34.9 | 21.6 | -38.3 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 66.5 | 45.6 | -31.5 | 149.8 | 150.6 | 0.6 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 13.9 | 14.3 | 2.8 | 42.2 | 50.1 | 18.6 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **513.5** | **456.5** | **-11.1** | **1,333.8** | **1,627.0** | **22.0** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 40.8 | 37.5 | -8.0 | 101.4 | 113.9 | 12.3 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 246.2 | 238.9 | -3.0 | 700.4 | 866.2 | 23.7 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 44.4 | 63.2 | 42.2 | 122.4 | 166.8 | 36.2 |
| 67 යකඩ හා වානේ | 100.4 | 47.7 | -52.5 | 184.4 | 240.6 | 30.5 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **389.9** | **282.7** | **-27.5** | **962.4** | **850.0** | **-11.7** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 61.4 | 52.7 | -14.2 | 160.1 | 165.4 | 3.3 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 52.7 | 46.9 | -11.0 | 153.5 | 151.7 | -1.2 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 36.7 | 22.5 | -38.7 | 86.0 | 72.1 | -16.2 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 79.4 | 42.0 | -47.1 | 203.0 | 107.8 | -46.9 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 77.1 | 65.9 | -14.5 | 186.5 | 200.3 | 7.4 |
| 78 රථවාහන | 32.2 | 18.4 | -43.0 | 87.7 | 56.5 | -35.6 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **82.4** | **72.3** | **-12.3** | **228.8** | **245.4** | **7.2** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 15.8 | 19.8 | 25.5 | 45.3 | 60.7 | 34.1 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 19.8 | 14.1 | -28.8 | 54.1 | 47.2 | -12.7 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.3** | **1.6** | **502.2** | **2.8** | **2.6** | **-6.2** |
| **මුළු ආනයන** | **1,925.9** | **1,818.9** | **-5.6** | **5,041.1** | **5,651.2** | **12.1** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf